---

**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - 2013**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංවිධානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශණයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංවිධානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්තවාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ සහ පුහුණු කටයුතු වෙනුවෙන් විවිධ ආයතන සහ සංවිධාන විසින් සංවිධානය වෙත 1985 සිට 2005 දක්වා කාලය තුළ ලැබී තිබුණු ප්‍රදාන රු.25,493,260 ක් සංවර්ධන සහ පුහුණු කටයුතු සඳහා වැයකර ඇතත් ගැලපීමකින් තොරව ප්‍රදාන යටතේ අඛණ්ඩව පෙන්වා තිබුණි.

(ආ) ගැරඬිඇල්ල නායයෑම් අවමකරණ ව්‍යාපෘතිය යටතේ සිදුකළ කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.6,167,402 ක වියදම් සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි.

(ඇ) පර්යේෂණ සහ සංවර්ධන වියදම් වශයෙන් මූල්‍ය කාර්යසාධන වාර්තාවේ රු.11,641,621 ක මුදලක් පෙන්වා තිබුණු නමුත් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ඊට අදාල විස්තරාත්මක සටහනේ එම වියදම රු.10,735,000 ක් වශයෙන් පෙන්වා තිබුණි.

(ඈ) නායයෑම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ අංශය විසින් 2012 වර්ෂය තුළදී බාහිර පාර්ශවයන් 09 ක් වෙත සිදුකරන ලද සේවාවන් වෙනුවෙන් රු.7,024,787 ක මුදලක් අයකර ගැනීමට වර්ෂ දෙකක් ගතවී තිබුණු අතර එම වටිනාකම ණයගැතියන් යටතේ දක්වනවා වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ඉ) 2014 වර්ෂයේදී මිළදී ගෙන තිබුණු රු.18,708,860 ක් වටිනා වැසිජල මැණුම් උපකරණ 2013 වර්ෂයේ මිළදීගත් වත්කමක් සේ සළකා ඒ වෙනුවෙන් රු.29,000 ක් ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණි.

(ඊ) නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත් කිරිම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා 15 කින් සමාලෝචිත වර්ෂය සඳහා රු. 846,360 ක් හා ඉකුත් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා 04 කින් ලැබිය යුතු රු.141,933 ක ආදායම් ගිණුම් ගත කර නොතිබුණි.

**2.2.2 ලැබිය යුතු ගිණුම්**

පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ ණයගැති ශේෂයන් ගෙන් සියයට 16 ක් නියෝජනය වූ රු.4,602,121 ක් වර්ෂ 5 සිට 17 දක්වා වූ කාල පරාසයක් තුළ තිබෙන නමුත් එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සංවිධානය විසින් 2010 වර්ෂය තුළදී මිලදී ගැනීම් හා පර්යේෂණ කටයුතු සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදලට වඩා වැඩියෙන් වියදම් කර තිබුණු රු.10,500,000 ක් ලැබියයුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

භූ තාක්ෂණ ඉංජිනේරු හා පර්යේෂණ අංශය, ව්‍යාපෘති කළමනාකරණ අංශය සහ නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය යටතේ කෙරීගෙන යන වැඩ වශයෙන් පෙන්වා තිබුණු රු.17,666,169 ක ශේෂය සම්බන්ධ ප්‍රගති වාර්තා, සහතික කළ බිල්පත් යනාදී සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලාංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය xv වැනි පරිච්ඡේදයේ 9.4 වගන්තිය | විදේශ ගමනකදී නිලධාරියකුට අවුරුදු 05 ක කාල පරිච්ඡේදයක් තුළදී උණුසුම් ඇඳුම් දීමනාව එක් වරකට වඩා ලබා නොදිය යුතු වුවද, එක් නිලධාරියකුට 2012 සහ 2013 යන වර්ෂ 02 ක තුළදී පිළිවෙලින් රු.15,173 ක් සහ රු.15,176 ක් බැගින් උණුසුම් ඇඳුම් දීමනාව ගෙවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලාංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 371( 2) | අත්තිකාරම් ලෙස ලබාදුන් මුදල් කාර්ය නිමකල විගසම අත්තිකාරම් පියවිය යුතුය. කෙසේ වුවද, එම අවශ්‍යතාවයන්ට අනුකූල නොවී අවස්ථා 57 කදී එකතුව රු.1,589,263 ක අත්තිකාරම් මුදල් මාස සිට 02 මාස 06 දක්වා කාල පරාසයක් තුළ ප්‍රමාද කර පියවා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 ( 5 ) | අත්තිකාරම් ලෙස ලබාදුන් සියළුම මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට එසේ නිරවුල් නොකළ අත්තිකාරම් මුදල් වල එකතුව රු.455,277 ක් විය. |
| (iii) මුදල් රෙගුලාසි 757(1) (අ) සහ (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගබඩාවේ භාණ්ඩ ලේඛණ පොත තුලනය කර ඒවා නිවැරදි බවට ගබඩා නිලධාරියා විසින් සහතිකයක් ලබාදී නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 1647 | ආයතනය සතුව තිබෙන වාහන 18 ක් සම්බන්ධයෙන් ඒවායේ උපකරණ පිළිබඳව සම්පූර්ණ සමීක්ෂණයක් වාර්ෂිකව පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම මාස 06 කට වරක්ම සංවිධානය සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවද, ආයතනය සතු වාහන සම්බන්ධව ඉන්ධන දැවීම සමාලෝචිත වර්ෂයේදී එක් වරක්වත් පරීක්ෂාකර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.11,227,959 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.21,461,664 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයහි රු.10,233,705 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂය තුළ සංවිධානයේ විවිධ අංශවල ආදායම රු.36,962,917 කින් වැඩිවී තිබුණු අතර පර්යේෂණ ප්‍රදාන ලෙස ලැබී තිබුණු මුදල රු.11,160,000 කින් වැඩිවී තිබුණද,

මෙහෙයුම් වියදම් රු.63,637,836 කින් වැඩිවී තිබීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

ආපදා අවදානම අවමකරණය සහ සුරක්ෂිත නිර්මිත පරිසරයක් උදෙසා පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය හා තාක්ෂණික දායකත්වය සැපයීම සංවිධානයේ ප්‍රධාන මෙහෙවර වන අතර, නායයෑම් උපද්‍රව කලාප සිතියම්ගතකරණය, නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති පවත්වාගෙන යෑම සහ නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත් කිරිම මූලික කාර්යය වී තිබුණි. මෙම මෙහෙවර හා කාර්යයන් ඉටුකිරීමේදී සමාලෝචිත වර්ෂය අවසානයට සංවිධානය විසින් ලඟාකරගෙන තිබූ කාර්යසාධනය පිළිබඳ සමස්ත තොරතුරු පහත දැක්වේ.

**(අ) නායයෑම් ආපදා කලාප සිතියම්ගතකරණ ව්‍යාපෘතිය**

සංවිධානය විසින් නායයෑම් අවදානම හඳුනාගැනීම, සීමා නිර්ණය කිරීම හා ඒ සම්බන්ධිත අවදානම 1:10,000 සහ 1:50,000 යන පරිමාණවලට සිතියම්ගතකිරීම මගින් තක්සේරුවකට ලක්කිරීම සිදුකරනු ලබන අතර, සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික්ක 11 ක වර්ග කිලෝ මීටර 32,972 ක් සිතියම්ගතකිරීමට නියමිතවී තිබුණි.

පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආපදා කලාප සිතියම්ගතකරණ ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්ක 10 ක වර්ග කිලෝමීටර 6,720 ක් තුළ 1:10,000 පරිමාණයේ සිතියම් ගතකිරීම් 168 ක් කිරීමට නියමිතව තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට වර්ග කිලෝමීටර 2,320 ක් සඳහාවූ සිතියම් 58 ක් සකස්කර අවසන් කිරීමට නොහැකිවී තිබුණි.

(ii) සිතියම්ගතකරණ කටයුතු සඳහා සකස් කරන ලද භෞතික සැලසුම්වල අදාල සිතියම් ගතකිරීම නිම කළයුතු කාලය නිශ්චය කර දක්වා තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට අර්ධ වශයෙන් නිමකරන ලද සිතියම් 51 ක් වූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් අදාල සිතියම්කරන කටයුතුවල මූල්‍යමය ප්‍රගතිය අයවැය ඇස්තමේන්තුව සමඟ සැසඳෙන පරිදි වර්ෂය අවසානයේදී නැවත ගලපනු ලබන බැවින් මෙම කටයුතුවල භෞතික ප්‍රගතිය හා ඉතිරිවූ ප්‍රතිපාදන සම්බන්ධ විස්තර විගණනයට ලබාගැනීමට නොහැකිවිය.

---

**(ආ) නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත් කිරිම**

සංවිධානය විසින් විගණනයට ලබාදුන් තොරතුරු අනුව, නායයෑම් අවදානම් සහිත ප්‍රදේශවල සිදුකරනු ලබන කිසියම් ගොඩනැගිලි සංවර්ධන කාර්යයන් සඳහා අනුමැතිය ලබාගැනීමට ප්‍රථම ගොඩනැගිල්ල ඉදිකරනු ලබන පාර්ශවයන් විසින් නායයෑම් අවදානම් තක්සේරු කිරීමේ වාර්තාවක් අදාළ පළාත් පාලන ආයතන හරහා ලබාගැනීමට කටයුතු කළ යුතුය. මෙම කාර්ය සඳහා සංවිධානය විසින් දිස්ත්‍රික්ක 10 ක කාර්යාල පිහිටුවා තිබුණි. නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත් කිරීම සම්බන්ධයෙන් නායයෑම් හා පර්යේෂණ අංශයේ සහ දිස්ත්‍රික් කාර්යාලවලින් ලබාගත් තොරතුරු අනුව, මෙම වාර්තා නිකුත් කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ රු.30,475,433 ක ආදායමක් උපයාගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නායයෑම් අවදානම් පවතින ප්‍රදේශ ආශ්‍රිත ගම්මානවල සිදුකරනු ලබන ඉදිකිරීම් සම්බන්ධයෙන් අදාල සහතික ලබාගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව ජනතාව දැනුවත්වී නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණයවූ අතර, මේ කරුණු සම්බන්ධයෙන් ග්‍රාමසේවක නිලධාරීන් ජනතාව සමඟ නිසි සම්බන්ධීකරණයක් පවත්වා නොතිබුණි. ඒ අනුව පෞද්ගලිකව සිදුකරන ලද ඉදිකිරීම් සම්බන්ධයෙන් මෙවැනි සහතික ලබාගැනීම සිදුවී නොතිබු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ii) නායයෑම් අවදානම් තක්සේරු කිරීමේ වාර්තා නිකුත් කිරීමේදී ප්‍රතික්ෂේප වු ඉල්ලුම්පත් නැවත ඉදිරිපත්කර අනුමැතිය ලබාගැනීමට තිබෙන ඉඩ ප්‍රස්ථාව වැළකීයන පරිදි අදාල තක්සේරු වාර්තා ලබාගැනීමට කරනු ලබන ඉල්ලුම් පත් හා ප්‍රතික්ෂේප කරන ලද වාර්තා සම්බන්ධ දත්ත ගබඩාවක් පවත්වා නොතිබුණි. තවද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ පදියපැලැල්ල ග්‍රාමනිලධාරි වසමේ පදියපැලැල්ල සුළු පරිමාණ විදුලිබල ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් සඳහා සංවිධානය විසින් ලබාදුන් යෝග්‍යතාවය පිළිබඳ මූලික භූ සමීක්ෂණ වාර්තාවේ නිරීක්ෂණය අනුව මෙම භූමියෙහි නායයෑමේ අවදානම් තත්ත්වයක් පවතින බැවින් යෝජිත ඉදිකිරීම සඳහා එම භූමිය සුදුසු නොවන බව නිගමනය කර තිබියදීත් අදාල පාර්ශවයන් විසින් එම වාර්තාව නොසලකා රු.2,087,960 ක් වැය කර ඉදිකිරීම් සිදුකර තිබුණි.මේ සම්බන්ධයෙන් සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පැහැදිලි කිරීම වූයේ සංවිධානය විසින් නිකුත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් පසුවිපරම් කිරීමට නෛතික බලයක් සංවිධානයට නොමැති අතර ඒ සම්බන්ධයෙන් අදාල පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වියයුතු බවත්ය.

(iii) අදාල සහතික නිකුත්කිරීම සඳහා ප්‍රාදේශීය සභාවලින් රු.27,466,943 ක් අයකර තිබුණු නමුත් 2013 දෙසැම්බර් 31 දිනට රු.948,393 ක මුදලක් සංවිධානය වෙත ප්‍රේෂණය නොකර පැවතීමෙන් පෙනී ගොස් තිබුණේ ප්‍රාදේශිය සභාවලින් අයකරගනු ලබන මුදල් සංවිධානය වෙත ප්‍රේෂණය කිරීමේ ක්‍රමවේදය විධිමත්ව පවත්වා නොතිබුණු බවයි.

**(ඇ) ගැරඩිඇල්ල නායයෑම් අවමකරණ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය යටතේ අදාල ප්‍රදේශයේ නායයෑම පිළිබඳ තර්ජනයට දැඩි ලෙස මුහුණපා තිබුණු නිවාස 50 ක් එම අවදානමෙන් මුදාගැනීම, සුන්බුන් ගලාඒම වෙනත් ප්‍රදේශයකට හැරවීම සඳහා පස් පුරවා බැම්මක් ඉදිකිරීම සහ ප්‍රධාන මාර්ග කිහිපයක් නැවත තැනීම 2012 සිට 2016 දක්වා කාලය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත විය. මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.93,011,363 ක් විය. ඉන්, ඉකුත් වර්ෂයේදී නිම කළයුතු පිරිවැය වටිනාකම රු.12,750,000 ක් වූ වැඩ කොටස් එම වර්ෂය තුළදී නිම කර නොතිබුණු අතර, එම වැඩ කොටස් වලින් පිරිවැය රු.11,550,000 ක වැඩ කොටස් 2013 ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර නොතිබුණි.

**4.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

සංවිධානයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2012 මාර්තු 02 දින අනුමත කර තිබුණද, 2013 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවති සේවක සංඛ්‍යාව 57 ක් විය. එසේම නිත්‍ය තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු සේවක සංඛ්‍යාව 41 ක් විය. සංවිධානයේ කටයුතුවලට ඍජුවම සම්බන්ධවන කළමනාකරණ සහකාර ( තාක්ෂණික) තනතුරු 27 ක් පුරප්පාඩුවී පැවති අතර ඒ සඳහා නිලධාරීන් බඳවා ගැනීම වර්ෂ දෙකක කාලයක් ප්‍රමාදවී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ස්ථාපිත කිරීම**

ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, ඉංජිනේරු සංස්ථාව සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ පාංශු පර්යේෂණ විද්‍යාගාරය යන ආයතන වෙත පැවරී තිබුණු කාර්යයන් ඉටුකිරීම සඳහා වූ වෙනම ආයතනයක් වශයෙන් 1993 සැප්තැම්බර් 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ මෙම සංවිධානය පිහිටුවා තිබුණි. පාර්ලිමේන්තු පනතක් යටතේ විධිමත් රාජ්‍ය ආයතනයක් ලෙස සංවිධානය සංස්ථාපනයවී නොතිබීම හේතුවෙන් අවදානම් සහිත ප්‍රදේශවල සිදුකරනු ලබන ඉදිකිරීම්වලට එරෙහිව සංවිධානයට ගතහැකි නීතිමය පියවර සීමාසහිත වූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

**5.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

සංවිධානයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, අපේක්ෂිත භෞතික කාර්යසාධනය පදනම් කර නොගෙන එය මූල්‍යමය ඉලක්ක සපුරා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ආපදා කලාප සිතියම්ගත කිරීම, නායයෑම් අවමකරණය සඳහා සිදුකරනු ලබන ඉදිකිරීම් යනාදිය සම්බන්ධ භෞතික කාර්යසාධනය ඇගැයීමට විගණනයේදී නොහැකි විය.

**5.3 අභ්‍යන්තර විගණනය**

සංවිධානයේ අභ්‍යන්තර විගණන අංශය එක් නිලධාරියෙකුගෙන් සමන්විතව තිබුණු අතර සංවිධානයේ ප්‍රධාන අංශ යටතේ ඉටුකරන ලද කාර්යයන් සම්බන්ධ ගෙවීම් හා භෞතික කාර්යසාධනය ඉටුකිරීමේ ප්‍රගතිය වැනි කරුණු සමාලෝචිත වර්ෂය තුළදී අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂා කර නොතිබුණි.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

අයවැය ලේඛණය සඳහා වූ මූල්‍යමය ඉලක්ක පිළියෙල කිරීමේදී ඒ සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණු බවත්, අයවැයගත ආදායම් සහ වියදම් ඉලක්කයන් සපුරා ගැනීමට පසු විපරම් කටයුතු සඳහා ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා කටයුතු කර නොතිබුණු බව අයවැයගත සංඛ්‍යා සහ තථ්‍ය සංඛ්‍යා අතර පැවති විශාල වෙනස්කම් වලින් පැහැදිලි විය. ඒ අනුව, අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කර නොතිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

**5.5 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම**

සංවිධානය විසින් ආපදා අවදානම් අවමකරණය සඳහා රටේ කඳුකර ප්‍රදේශවල නායයෑම් පිළිබඳ අධ්‍යයනයන් සිදුකරමින් ඒ හා බැඳුණු අවදානම් ප්‍රදේශවල සිතියම් සැකසීමත් සහ එම ප්‍රදේශවල සිදුකරනු ලබන ඉදිකිරීම් සම්බන්ධ නායයෑම් අවදානම් පිළිබඳ තක්සේරු වාර්තා නිකුත් කිරීමත් යන භාරදූර වගකීම උසුලයි.

නායයෑම් ආපදා කළාප සිතියම්ගත කිරීමේ වැඩ සටහන් මගින් නායයෑම් අවදානම් සහිත ප්‍රදේශවල පැතිරීම හඳුනාගෙන විවිධ ආයතන මගින් ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය, සංවර්ධන සැළසුම් සකස් කිරීම, පූර්ව නායයෑම් නිවේදන නිකුත් කිරීම, නායයෑම් අවදානම සහිත ප්‍රදේශවල ගොඩනැගිලි සඳහා අවසර ලබාගැනීමට භාවිතා කරනු ලැබේ.

උක්ත කරුණුවලට අමතරව 2013 ජුනි 30 දින වනවිට රු.2,677,773 ක් වැයකර නායයෑම්,සුනාමි සහ ගංවතුර යන ආපදාවලට ඔරොත්තු දෙන ආදර්ශ නිවාස 06 ක් ඉදිකර තිබුණි. සංවිධානය විසින් ආපදාවලට ඔරොත්තු දීම පිළිබඳ උපදෙස් අඩංගු අත්පොතක් සම්පාදනය කර තිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වරින් වර වාර්තා කරන ලදි. පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ණයගැති පාලනය
(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඈ) ව්‍යාපෘති කළමනාකරණය
(ඉ) අයවැය පාලනය